# ජෛන ආචාර ධර්ම පිළිබඳ අධ්‍යයනයක්

# A Study on Jain Ethics

මැටිබැඹියේ ධම්මසිරි හිමි

**Abstract**

Ethics is the study of the principles and values that should guide human behavior, in order to promote the common good and social justice. Ethics has been given the meaning of good conduct, custom, habit, appropriate customs, social rules and procedures. 'Acäravidya' in Jainism is defined as Ethics in the English language. The topic of ethics is discussed in many of the world's religious philosophies. Among them, the Jain Philosophy, which is a great philosophy that originated in India, also discusses about ethics and it can be pointed out as the primary objective of this research to inquire about it.

Ethics is a factor that changes individual behavior. It also leads to create a moral society. Many scholars are of the opinion that ethics started from the beginning of the human society. And with the evolution of society, the ethics have been evolved. Accordingly, with the emergence of many philosophies in the world, ethics has become a major topic. Jain Philosophy can be appreciated as a philosophy that preached an ethical system to the world based on the principle of Absolute Non-violence. At the time when Jainism was introduced, prayers to gods and goddesses and performing sacrifices, were prevalent in the Indian society. It is clear how the Jain Philosophy has introduced a system of

ethics to the society by excluding such useless things from the society.

Jain Philosophy showed that the mind is not important in ethics and gave the primacy to the bodily actions. It is explained that, it is good to contemplate on moral virtues and to abstain on performing bad actions through body, word and mind. Animals should be shown mercy and kindness without persecution. Telling truth, not stealing, eliminating cravings by donating food and even donating clothes and being naked have been shown as high virtues. It is clear that, Jain Philosophies have tried to create a virtuous society by introducing such a system of ethics. And the purpose of this research is to examine whether the ethics are consisted within the Jain Philosophy and the research problem relies to examine the impact of it on the human society. This research has been conducted using Primary and Secondary sources as the main sources. It was realized, here that an ethical system is needed to create a good society for the existing social perversions and it can be proved that the Jain Ethics has endeavored to gift a good ethical system to the society by knowing it well.

**Keywords**: Ethics, Jain Ethics, Personal Conduct, Morality, Society.

**හැඳින්වීම**

භාරතීය සමාජයේ ප්‍රභවය වූ ප්‍රධානම ආගමික හා දාර්ශනික සංකල්ප අතරින් වඩාත් අවධානය දිනා ගත් දර්ශනයකි ජෛන දර්ශනය. ක්‍රි.පූ. හයවන සියවස වන විට භාරතීය සමාජය ආර්ථීක, දේශපාලනික හා සමාජීය වශයෙන් බ්‍රාහ්මණයන්ගේ බල අධිකාරිත්වයට යටත්ව පැවතුණි. මෙම ක්‍රමවේදය යටතේ බ්‍රාහ්මණයන් හැර අනෙකුත් සමාජ පිරිස් වන ක්‍ෂත්‍රිය,

වෛශ්‍යය හා ශුද්‍ර යන පිරිස් පීඩාවට හා අසීරුතාවයට පත්විය. බ්‍රාහ්මණයන්ගේ මෙම පීඩාකාරී ක්‍රමවේදයන්ගෙන් නිදහස් වීම සඳහා සමාජය තුළින් ම පැන නැගුණු විකල්ප බලවේගය වන්නේ ශ්‍රමණ සම්ප්‍රදාය යි. එවකට සමාජය තුළ ශ්‍රමණ කණ්ඩායම් හයක් පැවැති බවට සාධක බෞද්ධ සූත්‍ර දේශනා තුළ සඳහන් වේ. සත්‍යය දැන ගැනීමේ කුතුහලයෙන් සිටි බොහෝ දෙනාට නිවැරදි මාවත පෙන්වීමට ශ්‍රමණ සම්ප්‍රදායට හැකි විය. ඒ අතරින් සමාජය පිළිබඳ දාර්ශනික ප්‍රවාහයන් ඉදිරිපත් කරමින් නව මාවතක් විවර කළ දර්ශනයක් වශයෙන් ජෛන දර්ශනය හැඳින්විය හැකි ය.

නිගණ්ඨනාථපුත්ත ශාස්තෘවරයා බුදුරජාණන් වහන්සේට සමකාලීනයකු වන අතර පාර්ශ්වනාථ නම් ශාස්තෘවරයාගෙන් පසුව ජෛන ශාසනයේ ශාස්තෘවරයා බවට පත්විය. ජෛන මහාවීර ශාස්තෘවරයා ඥාතික පුත්‍ර පෙළපතට අයත් වූ බැවින් ඥාත්‍රික පුත්‍ර හෙවත් නාථපුත්ත යනුවෙන් ද හඳුන්වයි. සිය මවගේ කුස පිළිසිඳගත් දිනයේ සිට දෙමාපියන්ගේ ධනය හා යසස හෙවත් කීර්තිය වර්ධනය වූ බැවින් වර්ධමාන මහාවීර යන නමින් ද ප්‍රසිද්ධ වූ බව ජෛන ආචාරාංග සූත්‍රයේ සඳහන් වේ (ආචාරඞ්ග සූත්‍ර (Screed Books of the East Vol 22. P.249).

ජෛන ආගමික සාහිත්‍යයේ එන තොරතුරුවලට අනුව ජෛන ශාසනයේ වඩාත් ප්‍රසිද්ධියට පත් ශාස්තෘවරයා වූයේ නිගණ්ඨනාථපුත්ත ශාස්තෘවරයායි. කෙසේ වුවද ෂට් ශාස්තෘවරුන් අතරින් විශාල ආගමික පිරිසක් සහ ජනප්‍රසාදයක් මෙම ශාස්තෘවරයාට පැවැති බව පැහැදිලි ය. එහෙත් උතුරුදිග භාරතයේ බුදුදහම තරම් ජෛන ආගම ප්‍රචලිත නොතිබුනි. ජෛනාගම ආරම්භ වී වැඩි කාලයක් යන්නට පෙර සංඝ සමාජය ශ්වේතාම්බර හා දිගම්බර යනුවෙන් දෙකඩ විය. එසේ වූයේ ජෛන දර්ශනය පිළිබඳව වූ මතභේදය නිසා නොව ආගමික පුරුද්දක් ගැන වූ මතභේදයක් නිසාවෙනි. මෝක්ෂය ලබා ගැනීම සඳහා ලෞකික වස්තූන් පරිත්‍යාග කිරීමේ දී ඇඳුම පවා ඉවත දමා නග්නව නිර්වස්ත්‍රව වෘත සමාදන් විය යුතු බව දිගම්බර සම්ප්‍රදායිකයින් ප්‍රකාශ කළහ. ජෛන සංඝයා සුදු ඇඳුමින් හැසිර

ව්‍රත අනුගමනය කිරීම යහපත් බව ශ්වේතම්බරයෝ ප්‍රකාශ කළහ (වීරරත්න, 1995, පි. 26).

භාරතීය දර්ශන ඉතිහාසයේ පහළ වූ ෂට් ශාස්තෘවරු අතරින් කර්මය හා කර්ම ඵලය පිළිගත් එකම ශාස්තෘවරයා වන්නේ නිගණ්ඨනාථපුත්ත ශාස්තෘවරයා යි. ප්‍රධාන ඉගැන්වීම වූයේ චතුයාම සංවරය යි. ඊට අමතරව පරම අවිහිංසාවාදය, කර්මවාදය (පුබ්බේකතහේතුවාදය ඇතුළුව) ස්‍යාද්වාදය, ආත්මවාදය හා සත්තාවාදව යන ඉගැන්වීම් ඉදිරිපත් කළහ. මනසට වඩා කයට ප්‍රමුඛත්වය ලබා දුන් ජෛනයෝ අවිහිංසා සංකල්පය ප්‍රධාන ඉගැන්වීමක් කර ගනිමින් සිය ආචාර විද්‍යාත්මක පැතිකඩ පැහැදිලි කළහ. ජෛන දර්ශනයේ ඉතා උසස් ම ගුණධර්මය අවිහිංසාව යි. ජෛන භක්තිකයන් අන්‍ය දාර්ශනිකයන්ට වඩා දැඩි ලෙස අවිහිංසාව ආරක්ෂා කරමින් කටයුතු කරනු ලැබේ. වැලිකැට, දියබිංදු, ගස්, ගල්, පර්වත ආදී සියලු ද්‍රව්‍යයන්වල ද ජීවයක් ඇතැයි පිළිගන්නා බැවින් ප්‍රාණඝාතයෙන් වැළකීම සඳහා බලවත් ලෙස ශික්ෂාව පිළිපැදිය යුතු ය යන්න ඔවුන්ගේ මතය යි. ජෛන දර්ශනය මෙවැනි ආචාර ධර්ම පද්ධතියකින් යුක්ත බව හඳුනාගත හැකි ය.

## සාහිත්‍යය විමර්ශනය

ජෛන දර්ශනයෙන් ඉගැන්වෙන ආචාර ධර්ම පිළිබඳ අධ්‍යයනයක් යන මාතෘකාවට අදාළව බොහෝ මූලාශ්‍රවල සඳහන් වුව ද ඒ පිළිබඳ ඍජු පර්යේෂණයක් සිදු කර නොමැත. ආචාර ධර්ම පිළිබඳ පෙර අපරදිග විද්වතුන් පර්යේෂණ ක්ෂේත්‍රයට අදාළ ග්‍රන්ථ හා ශාස්ත්‍රීය ලිපි ප්‍රකාශයට පත්කර ඇතත් ඒවා තත් විෂය ක්ෂේත්‍රය පිළිබඳ පුළුල් පර්යේෂණ වශයෙන් සැළකීමට අපහසු ය. ආචාර ධර්ම යනු පුද්ගල ආකල්ප උද්දීපනය කරන සංකල්පයකි. අධ්‍යාත්මික ජීවිතයේ දී අධ්‍යාත්මිකව පිළිපැදිය යුතු ආචාර ධර්ම අගය කරන අතර ලෞකික ජීවිතයේ දී ලෞකික ආචාර ධර්ම කෙරෙහි සාකච්ඡා කරයි. ඒ අනුව ආචාර ධර්ම මෙන් ම ජෛන දර්ශනයෙන් ඉගැන්වෙන ආචාර ධර්ම පිළිබඳ උපයෝගී කරගත

හැකි ප්‍රාථමික හා වෙනත් ග්‍රන්ථ පිළිබඳ විමර්ශනයක යෙදීම මෙම සාහිත්‍ය විමර්ශනය තුළින් අපේක්ෂා කරනු ලබයි.

දීඝනිකාය සාමාඤ්ඤඵල සූත්‍රය මගින් භාරතීය සමාජයේ බුද්ධකාලීනව පැවති ආගම් හා දර්ශනවාද පිළිබඳ කරුණු අනාවරණය කරගත හැකි විය. එමගින් අපගේ පස්තුතය වන ජෛන ආචාර ධර්මවලට අදාළව කරුණු ගවේශණය කිරීමට හැකිවිය. තවද දීඝනිකායේ ම සිහනාද සූත්‍රය ආදී සූත්‍ර දේශනා අපගේ පර්යේෂණය සාර්ථක කරගැනීමට යොදාගන්නා ලදී. මජ්ඣිම නිකායේ කුක්කුරවති සූත්‍රය, අභයරාජ කුමාර සූත්‍රය, උපාලි සූත්‍රය මෙන් ම ධම්මපදය ද ප්‍රාථමික මූලාශ්‍ර වශයෙන් මෙම පර්යේෂණ කාර්යයේ දී ඉතා වැදගත් ග්‍රන්ථ වශයෙන් පෙන්වා දිය හැකි ය.

ධර්මබන්ධු අමරසේකර විසින් රචිත ජෛන ආගමය යන ග්‍රන්ථය තුළින් ජෛන දර්ශනයේ ස්වභාවය ජෛන ආචාර ධර්ම, විවිධ ව්‍රත, සීලමය ප්‍රතිපත්තීන් ආදී කරුණු කෙරෙහි අධ්‍යයනය කිරීමට ඉතා මහෝපකාරී විය. එමෙන් ම ජෛන පරම අවිහිංසා සංකල්පය මෙන් ම කර්ම සංකල්පය ආදී කරුණු ද එහි විස්තර වේ. එම කරුණු ආශ්‍රයෙන් අපගේ පර්යේෂණයට අදාළ කරුණු රාශියක් අදාළ කරගත හැකිවිය. හේ.මූ. තිලකරත්න විසින් රචිත පෙරදිග ආචාර ධර්ම නම් ග්‍රන්ථය ද ආචාර ධර්ම පිළිබඳ මෙන් ම, ජෛන දර්ශනයේ ආචාර ධර්ම පිළිබඳව අධ්‍යයනය කිරීම සඳහා බෙහෙවින් උපකාරී විය. එමගින් ජෛන පුණ්‍ය ක්‍රියා මෙන්ම පාප ක්‍රියාවන් ද මැනවින් හඳුනාගෙන පර්යේෂණයට අදාළ කරගත හැකි විය. දියගම නාරද හිමියන් විසින් රචිත ෂට් ශාස්තෘන් සහ බුදුදහම නමැති ග්‍රන්ථය තුළින් පාලි ත්‍රිපිටක දේශනාවන්ගේ ඇතුලත් ජෛන ආචාර ධර්ම පිළිබඳ අධ්‍යයනය කළ හැකිවිය. ඒ අනුව මෙම ග්‍රන්ථය ද අපගේ පර්යේෂණ කාර්යේ දී ජෛන ඉගැන්වීම් හා ජෛන ආචාර ධර්ම පිළිබඳ අධ්‍යයනය කිරීමට මහෝපකාරී වූ බව පැහැදිලි ය. තව ද මෙම පර්යේෂණයේ දී පනාමුරේ චන්දිම හිමියන් විසින් රචිත බෞද්ධ ආචාර විද්‍යාව නම් ග්‍රන්ථය ද, ඩී. ජේ. කළුපහන මහාතා විසින් රචිත මුල් බුදුසමයේ

ආචාර විද්‍යාව, නම් ග්‍රන්ථය ද පී.ඩී. ප්‍රේමසිරි මහතා විසින් රචිත බෞද්ධ ආචාර ධර්ම නම් ග්‍රන්ථය ද ආදී ග්‍රන්ථ කිහිපය ම අපගේ පර්යේෂණ කාර්යය සාර්ථක කරගැනීම සඳහා ද්විතීක මූලාශ්‍රය වශයෙන් භාවිත කෙරිණි. තවද ආචාර ධර්ම යන වචනයන්හි නිරුක්ති ආදිය දැනගැනීම සඳහා අලගියවන්න සංස්කෘත සිංහල ශබ්දකෝෂය, නිරුක්ති සහිත සිංහල ශබ්දකෝෂය, ශ්‍රී සුමංගල ශබ්දකෝෂය ආදී ශබ්දකෝෂයන් ද උපයෝගී කරගන්නා ලදී.

උක්ත විවිධ සාහිත්‍ය ග්‍රන්ථයන්හි අන්තර්ගතය කරුණු මෙන් ම පාලි ත්‍රිපිටකාගත තොරතුරු ද මෙම පර්යේෂණයට අදාළ කර කරගන්නා ලදී. මෙම පර්යේෂණයේ පාලි සූත්‍ර දේශනාවන් බහුලව යොදාගත් නිසා ද්විතීයික මූලාශ්‍රය යොදාගන්නා ලද්දේ ස්වල්පයක් පමණි. කෙසේ වෙතත් මෙම පර්යේෂණයෙන් අධ්‍යයනය කිරීමට බලාපොරොත්තු වූ ක්ෂේත්‍රය පිළිබඳව මීට ඉහත පර්යේෂණයක් සිදුකර නොමැත. ඒ අනුව අපගේ පර්යේෂණ කාර්ය සාර්ථක කරගැනීම සඳහා මෙම සාහිත්‍යය ග්‍රන්ථ මහෝපකාරී වූ බව කිව යුතු ය.

**පර්යේෂණ ගැටලුව**

ජෛන ආගමික ඉගැන්වීම් මගින් ආචාර ධර්ම පද්ධතියක් පිළිබිඹු වී තිබේ ද? කායික ක්‍රියාවන්ගෙන් වැළකී සදාචාරවත් සමාජයක් නිර්මාණය කිරීම සඳහා මඟපෙන්වීම සිදුකර ඇත්තේ කෙසේ ද? යන්නයි.

**පර්යේෂණ අරමුණු**

ආචාර ධර්ම යනු කුමක් දැයි හඳුනාගැනීම හා ජෛන දර්ශනයෙන් පෙන්වාදෙනු ලබන කායික ආචාර ධර්ම පිළිබඳ විමර්ශනය කිරීම මෙහි ප්‍රධාන අරමුණයි. ජෛන ආචාර ධර්ම සංකල්පවල අනන්‍යතා ලක්ෂණ හඳුනාගැනිම එමෙන් ම භාරතීය ආගමික දර්ශන අතරින් ප්‍රධාන ආගමික දර්ශනයක් වීමට මෙම කායික ආචාර ධර්ම මූලික වූ බව තහවුරු කිරීම මෙහි සෙසු අරමුණු වශයෙන් පෙන්වා දිය හැකි ය.

**පර්යේෂණ ක්‍රමවේදය**

මෙම පර්යේෂණය ප්‍රධාන වශයෙන් සාහිත්‍ය මූලාශ්‍රය පදනම් කරගෙන සිදුකරනු ලැබූ පර්යේෂණයකි. දත්ත එක් රැස් කිරීම සඳහා ප්‍රාථමික මූලාශ්‍රය වශයෙන් පාලි ත්‍රිපිටක ග්‍රන්ථත්, දෙවනුව ද්විතීයික මූලාශ්‍රය ලෙස ඒ පිළිබඳ ලියැවුණු පොත්පත් සහ වෙනත් පර්යේෂණ පත්‍රිකා ද පරිශීලනය කර ඇත. ප්‍රථමයෙන් දත්ත රැස්කිරීමත් අනතුරුව දත්ත විශ්ලේෂණයත් එමගින් නිගමනයන්ට එළඹීමත් සිදු කෙරින.

**පර්යේෂණයේ වැදගත්කම**

ආචාර විද්‍යාව දර්ශන විෂය යටතේ ගැනෙන එක් විෂය ක්ෂේත්‍රයකි. හරි වැරදි හොඳ නරක යුක්තිය හා සාධාරණත්වය යන මිනිස් ක්‍රියාවන් ආචාර විද්‍යාව විෂය ක්ෂේත්‍රය යටතේ ඇගයීමට ලක්කරනු ලබයි. වර්තමානයේ ද විශේෂයෙන් සාකච්ඡා කරනු ලබන විෂය ක්ෂේත්‍රයක් වශයෙන් බෞද්ධ ආචාර විද්‍යාව හැඳින්විය හැකි ය. ආචාර යන්නෙහි අර්ථය වන්නේ යහපත් හැසිරීම යන්න යි. ජෛන දර්ශනයට අනුව ශ්‍රාවකයෙකුගේ ජීවිතය කෙසේ සකස් විය යුතු ද යන්න මෙමගින් අවධාරණය කරයි. දිනෙන් දින දියුණුවන ලෝකයා හමුවේ යහපත් පැවැත්මේ ආවශ්‍යතාව මෙමගින් අවධාරණය කරයි. වර්තමානයේ පුද්ගලයාගේ භෞතික දියුණුව දැකගත හැකි වුව ද සදාචාරත්මක අතින් කෙසේ දියුණු විය යුතු ද, අන්‍යයන් කෙරෙහි දැක්විය යුතු සදාචාරක්මක පැතිකඩ මෙමගින් අවධාරණය කරයි. සමාජයෙන් යටපත් වෙමින් පවතින සදාචාරත්මක ක්‍රියා ආරක්ෂා කරමින් අන්‍යයන් කෙරෙහි සුහදසීලිව කටයුතු කළයුතු වන්නේ කෙසේ ද යන්න අධ්‍යයනය කිරීමට මෙම පර්යේෂණය ඉතා වැදගත් වේ. ආචාර ධර්ම යනු කුමක්දැයි අවබෝධ කරගෙන එම සංකල්ප ජෛන දර්ශනය තුළ කෙතෙක් දුරට අන්තර්ගත වී තිබේ ද යන්න මෙහි දී අධ්‍යයනය කළ හැකි ය. ඒ අනුව සමාජයේ සියල්ලන්ට ම ජෛන දර්ශනයෙන් පෙන්වා දෙන ආචාර ධර්ම කෙබඳු ද යන්න මෙමගින් අධ්‍යයනය කළ හැකි ය.

**සාකච්ඡාව**

භාරතීය දර්ශන ඉතිහාසයේ පහළ වූ ෂට් ශාස්තෘ දර්ශන අතරින් පැහැදිලි නිරවුල් දර්ශනයක් හෙළි කළ දාර්ශනිකයා වන්නේ ජෛන මහාවීර ය. ශාස්තෘවරු හයදෙනා අතරින් කිරියවාදි හෙවත් කර්මය පිළිගන්නා ලද දාර්ශනිකයා වන්නේ ද මොහු ය. මෙලොව පරලොව දෙකෙහි සුගතියක් ඇති කර ගැනීමට අත්තකිලමථානුයෝගයට අනුව කටයුතු කළයුතු ය. පාලි සූත්‍ර දේශනාවලට අනුව ජෛන දර්ශනයේ ප්‍රධාන ඉගැන්වීම් වන්නේ (අරියවිමල හිමි, 11 පිටුව).

1. පරම අවිහිංසාවාදය
2. කර්ම වාදය
3. ස්‍යාද්වාදය
4. ආත්මවාදය
5. සත්තාවාදය යි.

මෙම ඉගැන්වීම් අනුව භාරතීය දර්ශනවාදයේහි පහළ වූ ජනතා ප්‍රසාදය දිනාගත් දර්ශනවාදයක් වශයෙන් ජෛන දර්ශන හැඳින්විය හැකි ය. හේතු ප්‍රත්‍යය නිසා ලෝකයේ ඇතිවීම හා නැතිවීම සිදු වේ. සත්ත්වයා විසින් කරන ලද කුශලාකුශල කර්ම නිසා සසර සැප හෝ දුක් අනුභව කරයි. සංසාරයෙන් එතෙර වීමට යමෙක් කටයුතු කරන්නේ ද ඔහු ගිහිගෙයින් නික්ම බ්‍රහ්ම චරියාව රක්ෂා කළයුතු වේ. පරලොව සුගතිය ඇති කරගැනීමට බ්‍රාහ්මණයන් විසින් පෙන්වා දුන් දෙවිදේවතාවන්ට යාඥා කිරීම, බලි බිලී පූජා යාගහෝම පැවැත්වීම සාදාචාරවත් නො වන ක්‍රියා වශයෙන් උගන්වයි. සිත කය වචන යන තුන්දොරින් සිදුවන වැරදිවලින් වැළකී සදාචාරවත් ව ජීවත්වීම යෝග්‍ය බව ජෛන මතය යි (අමරසේකර, 1961, 17 පි.).

- සතුන්ට හිංසා නො කිරීම

- ඇත්ත කථා කිරීම
- සොරකම් නො කිරීම
- කයින් වචනයෙන් මනසින් සංවරවීම
- භවභෝග සම්පත් පරිත්‍යාගයෙන් ආශවන් නැතිකිරීම හා ඇඳිවත පවා පරිත්‍යාග කර නිරුවතින් සිටීම.

මෙම සියලු ගුණ ධර්මයන් පිළිපදිනවිට පුද්ගලයාගේ සිත සාමාදානයෙන් යුක්ත වේ. පින් ලබාගන්නා කුශල ක්‍රියාවන් ජෛන දර්ශනයෙන් විස්තර කර ඇත. දිළින්දන්ට ආහාරදීම, පැවිද්දන්ට සෙනසුන් කරවා දීම, පිපාසිතයන්ට පැන් දීම, දුප්පතුන්ට වස්ත්‍ර දීම ආදීය ඉන් කිපයකි. මෙවැනි ක්‍රියාවන් ධාර්මික ක්‍රියාවන් වශයෙන් හඳුන්වයි. අන්‍යයන්ට හිංසා පීඩා කිරීම, බොරුකීම, වංචාව, දුරාචාරය, බියසුළු කම, ඊර්ෂ්‍යාව, කෝපය, අහංකාරකම, රැවටීම, තණ්හාව, කේළාම් කීම, අපහාස කිරීම, බැණීම, කපටිකම, මිථ්‍යා දෘෂ්ටිය යන මෙවැනි ක්‍රියා අපාගත වන හෙවත් සදාචාරවත් නො වන ක්‍රියා වශයෙන් ජෛන ධර්මයේ දක්වා තිබේ.

පරම අවිහිංසාවාදය දේශනා කළ ජෛන මහාවීර මේ ලෝකයේ සියලු තැන සත්ත්වයන් ජීවත්වන බව පෙන්වා දෙයි. බෞද්ධ දර්ශනයේ මෙන් ජෛන දර්ශනයේ ද පංචසීල ප්‍රතිපදාවක් හඳුන්වා දෙයි. එහි එන සතුන් නො මැරීම යන ශික්ෂා පදයෙන් පරම අවිහිංසාවාදය පැහැදිලි කරයි. පුද්ගලයා ආශ්වාස ප්‍රාශ්වාස කිරීමේ දී කුඩා සතුන් මැරෙන බව ජෛනයෝ විශ්වාස කරති. ජෛන දර්ශනයෙන් උගන්වනු ලබන ඉතාමත් උසස් ම ගුණාංග යක් වන්නේ පරම අවිහිංසාවාදය යි. බෞද්ධ හින්දු දෙපක්ෂයට ම වඩා දැඩි ප්‍රතිපත්තියෙන් ජෛනයන් අවිහිංසාව ආරක්ෂා කරනු ලබන්නේ වේ. සියලු ජීවීන්ගේ ආරක්ෂාව පිළිබඳ ඉතා උද්යෝග යෙන් විමසනු ලබයි. සියලු ප්‍රාණීන්ගේ ප්‍රාණය ආරක්ෂා කරදීම පිළිබඳ දැඩි ප්‍රතිපත්ති හඳුන්වා දී තිබේ. බෞද්ධ දර්ශනයේ දී මනසට මූලිකත්වය දුන්න ද ජෛන දර්ශනයේ දී කයට මූලිකත්වය දෙමින් පරම අවිහිංසාවාදය දේශනා කර තිබේ. වැලිකැට, දියබිංදු

ගස් ගල් පර්වත ආදී සියලු ද්‍රව්‍යයන් තුළ ජීවයක් ඇතැයි පෙන්වා දෙන නිසා ප්‍රාණඝාතයෙන් වැළකීම සඳහා බලවත් අයුරින් ශික්ෂාපද ආරක්ෂා කළයුතු වේ. චතුයාම සංවරය තුළින් ද ජෛන දර්ශනයේ හඳුන්වා දෙන පරම අවිහිංසාවාදය තෙරුම් ගත හැකි ය (දී.නි, I, සාමඤ්ඤඵල සූත්‍රය, 100 පි.).

1. සබ්බවාරි වාරිතො ච හොති :- සියලු සිසිල් දියෙන් වැළකීම පළමු සංවරය යි. ප්‍රාණීන් විනාශවීමට ඇති ඉඩකඩ වළක්වා ලීම මෙම සංවරයෙන් බලාපොරොත්තු වේ.

2. සබ්බවාරියුතො ච හොති :- සියලු සංවරයෙන් යුක්ත වීම.

3. සබ්බවාරිධුතො ච හොති :- සියලු පව් පිඹ හළබව මින් අදහස් කරයි.

4. සබ්බවාරිඵුයො ච හොති :- සියලු පව් නිවාරණයෙන් මෝක්ෂය ස්පර්ශ කළ බව

ඒ බව පෙන්වා දී ඇත්තේ පුද්ගලයා විසින් ත්‍රිදණ්ඩය මුල්කර ගනිමින් සිදුකරනු ලබන කර්ම තමන් පසුපස පැමිණෙන බවත්, එකී කර්මවලින් මිදීමට පුද්ගලයා ක්‍රියා කළ යුතුබවත් තමන් අතින් සිදු වූ කර්ම ක්ෂය කරගැනීම සඳහා ද නව කර්ම සිදු නො වීම සඳහා ද ඔහු චතුයාම සංවරය ඉදිරිපත් කළබව සාමඤ්ඤඵල සූත්‍රය දක්වයි.

''නිඝන්ථො නාථ පුත්තො සන්දිට්ඨිකං සාමඤ්ඤඵලං ඵුට්ඨො සමානො චතුයාම සංවරං බ්‍යාකාසි....'' (දී.නි, I, සාමඤ්ඤඵල සූත්‍රය, 90 පි.)

ජලයෙහි ඇති කුඩා ප්‍රාණීන් මැරෙතැයි සිතා වතුර පෙරා පානය කරනු ලබයි. හුස්ම ගැනීමේ දී පවා වාතයෙන් පාවෙන ක්ෂුද්‍ර ජීවීන් මුඛයට නො පිවිසීම පිණිස මුඛවාඩම් බැඳ ගමන් කරනු ලබයි. ශරීරයෙහි වැඩෙන උකුණන් වැනි සතුන් මැරෙයි

යන බියෙන් හිස නො පීරයි. කටේ ඇතිවන පණුවන් මරණයට පත්වේය යන බියෙන් දත් නො මදී. තාපසයෝ සතුන් මැරේ යන බියෙන් තණකොළ නො පාගති. කුඩා ප්‍රාණීන් මැරෙන නිසා බිම අතුගාමින් ගමන් කරයි. මේ අයුරින් සදාචාරවත් ජීවිතයක් ගත කර ඇත්තේ පරම අවිහිංසාවාදය ලෝකයට ප්‍රකට කිරීමට ය (අමරසේකර ධර්මබන්ධු, ජෛන ආගම, 1961, 18 පි.). ලොව බොහෝ දෙනා ප්‍රාණඝාතය සිදුකරන්නේ ජීවිතයන්ගේ වටිනාකම නිවැරදි ව තේරුම් නො ගෙන ය. එවන් පසුබිමක ජෛන දහම ලෝකයට සාධාරණත්වය අගය කරන වටපිටාවක් නිර්මාණය කරමින් ජීවීන්ගේ වටිනාකම අවධාරණය කර ඇත. ජෛන දර්ශනයේ මෙම පරම අවිහිංසාව තුළ ඇතැම් ඉගැන්වීම් යථාර්ථවාදී මෙන් ම ප්‍රායෝගික නොවුව ද අවිහිංසාවාදී සංකල්ප සමාජ ගතකිරීම තුළ විශාල සමාජ සදාචාර වර්ධනයක් ඇතිවිය. මිනිසුන් අතර පමණක් නොව මිනිසුන් සිවුපාවුන් කෙරෙහි ද අවිහිංසාවාදී සිතිවිලි පහළ කිරීම තුළ හිංසාව පිටුදකින සමාජයක් නිර්මාණය කරගත හැකි ය.

ජෛන දර්ශනය තුළ මෝක්ෂය ලබාගැනීම සඳහා බලාපොරොත්තු වන උපාසකයන් විසින් පිළිපැදිය යුතු ගුණධර්ම රාශියක් උගන්වා ඇත. සංවර ශීල වශයෙන් පිළිපැදිය යුතු සදාචාරවත් ප්‍රතිපත්තින් 1800 ක් පමණ වේ. ඒ අතරින් ජෛන දර්ශනයෙන් හෙළිවන සාධාරණත්වය මෙම ප්‍රකාශයන් තුළින් ගම්‍ය වන බව පැහැදිලි ය.

සම්‍යක් කර්මාන්තයෙහි යෙදිය යුතු ය. අනුන් හට පීඩා වන හිරිහැර වන අලාභ හානි සිදු වන කිසිම දෙයක් නො කළ යුතු ය.

- මත්පැන් සෑදීම හා විකිණීම නො කළ යුතු ය.
- නපුරු ආයුධ විකිණීමෙන් වැළකිය යුතු ය.
- ප්‍රාණඝාතය නො කළ යුතු ය, නො කර විය යුතු ය.

- හොරකමින්, වංචාවෙන්, කූට ප්‍රයෝග මාර්ගයෙන් ධනය රැස් නො කළ යුතු ය.
- සුදුසු වයසෙහි දී තමාට ගැළපෙන සදාචාර සම්පන්න ගුණ නුවණින් යුත් කාන්තාවක් හා විවාහ විය යුතු ය.
- මත්පැන් බීම, සුදු කෙළීම, මස්මාංශ අනුභවය වැනි ක්‍රියාවන්ගෙන් වෙන්විය යුතු ය.
- උසස් උතුම් ගුණ ධර්මයන්හි පිහිටි සත්පුරුෂ උතුමන් කෙරෙහි ගරු සැලකිලි කළ යුතු ය.
- පස්කම් සැප විඳීමට අධික ලෙස ආසා නො කළ යුතු ය.
- අධර්මිෂ්ට රජුන්, ඇමතියන් නිලධාරීන් ආදී දුෂ්ට පාලකයන් වසන ගම් නියම්ගම් රාජධානීවලින් ඈත්ව වාසය කළ යුතු ය.
- සත්පුරුෂ කල්‍යාණ මිත්‍රයන් ආශ්‍රය කළ යුතු ය.
- අශිෂ්ට දුරාචාර පැවතුම් ඇති හීන දීන ජනයා සමග නො විසිය යුතු ය.
- තමා පදිංචි ප්‍රදේශයේ නීතියට සිරිත් විරිත්වලට එකඟ ව අවිරුද්ධ ව වාසය කළ යුතු ය.
- අනුන් බිඳවන කේළම් බස් කීමෙන් වැළකිය යුතු ය.
- අසත්පුරුෂ චණ්ඩ දාමරික මිනිසුන් ආශ්‍රය නො කළ යුතු ය.
- මවුපියන්ට ගුරුවර බන්ධු මිත්‍රාදීන්ට ගරු සත්කාර කළ යුතු ය.
- අන්‍යයන්ගේ සිත කෝපවන කළකිරෙන කිසිවක් නො කළ යුතු ය.

- දැසි දස් මෙහෙකරුවන්ට සැළකිය යුතු ය.
- අඹුදරුවන් මනා සේ පෝෂ්‍ය කළ යුතු ය ඔවුන්ට හිංසා පීඩා නො කළ යුතු ය.
- හැමදෙනා සමග ම මිත්‍රත්වයෙන් කාලය ගතකළ යුතු අතර කිසිවෙකුට ඊර්ෂ්‍යා නො කළ යුතු ය.
- ආදර්ශවත් ජීවිතයක් ගත කිරීමට උත්සාහ ගතයුතු ය.
- සිල්වත් ගුණවත් අයට හා ගුණවෘධ වයෝවෘධ ගරු කටයුතු ඇත්තන්ට ගරු සැළකිලි දැක්විය යුතු ය.
- දිනපතා බණ දහම් ඇසීම, දහම් පොත් කියවීම අමතක නො කළ යුතු ය.
- අන්සතු වස්තුවෙහි ආශා නො කළ යුතු ය.
- සැර පරුෂ ගති දුරු කළ යුතු ය. මෘදු මොළොක් විය යුතු ය.
- පෙහෙවස් රැකිය යුතු ය.
- අනිත්‍ය, අසරණ, ආශ්‍රව, මෛත්‍රී කරුණා මුදිතාදිය සිහිකරමින් භාවනා වැඩිය යුතු ය. (අමරසේකර, 1961, 27 -30 පිටු).

ශීලය මූලික කරගත් ප්‍රතිපත්තීන් රාශියක් පෙන්වා දෙන ජෛන දාර්ශනිකයන් වෙනත් පුද්ගලයනට කරදරයක් දුකක් කණගාටුවක් ඇති නො වන පරිදි ශීලය ආරක්ෂා කිරීමට කටයුතු කළයුතු ය. එසේ කිරීමෙන් ජෛන ශීලයට අනුව මෝක්ෂය ලැබිය හැකි ය. මොක්ෂය ලැබීමට නම් තමා තුළ තිබෙන දුර්ගුණ ඉවත දමා මෙවැනි යහපත් ගුණ ධර්ම හදවත් තුළ පෝෂණය කරමින් සදාචාරවත් ව ජීවත්විය යුතු ය. තවද ජෛන දර්ශනයේ ධර්ම යන පදයෙන් යුක්තිය, සාධාරණත්වය, විනිශ්චය වැනි පුලුල් අර්ථ

රාශියක් අදහස් කරනු ලබයි. ධර්ම යන පදය යටතේ මෝක්ෂය ලැබීම සඳහා අවශ්‍ය ධර්ම කාරණා දහයක් දස ධර්ම වශයෙන් හඳුන්වා ඇත. (අමරසේකර, 1961, 36 පි).

1. ශාන්තිය
2. ඍජු බව
3. මෘදු බව
4. අලෝභය
5. ඉච්ඡා නිරෝධය
6. ඉන්ද්‍රියනිග්‍රස්ථාන
7. සත්‍ය වචන
8. අදත්තාදාන විරමනය
9. පරිග්‍රහ ත්‍යාගය
10. බ්‍රහ්ම චර්යා වශයෙනි.

තවද මෝක්ෂලාභය සඳහා ශ්‍රද්ධාව හා භාවනාව පුරුදු පුහුණු කළ යුතු ය. ශ්‍රද්ධාව යනුවෙන් හඳුන්වනු ලබන්නේ මහාවීරතුමාගේ ධර්මය පිළිබඳ විශ්වාසය යි. භාවනාව වශයෙන් හඳුන්වනු ලබන්නේ චිත්තේග්‍රතාව ඇති කරගැනීම යි. ඒ සඳහා අනිත්‍ය භාවනාව, අසරණ භාවනාව, ආශ්‍රව භාවනාව, ධර්ම ස්වභාවාඛ්‍යාතතා භාවනාව, ආදී භාවනා වඩමින් කෙලෙස් නිමාකර ධර්මය අවබෝධ කරගත යුතු බව දක්වයි. ධර්ම යන පදය මූලික කරගනිමින් ජෛන ධර්මය නව අර්ථකතනයන් සපයා ඇත. ලෝකයෙහි යථා ස්වභාවය පෙන්වා දෙමින් එය උත්පාද, ව්‍යය හා ද්‍රව්‍යය යනුවෙන් කොටස් තුනකින් යුක්ත බව ප්‍රකට කරයි (Balbir, 1976, p.116). මූලධර්මවල ක්‍රියාකාරීත්වය ජීව අජීව වශයෙන් වරගීකරණයට ලක් කර තිබේ. ජෛන ධර්මයට

අනුව පුද්ගල, ආකාශ, කාල, ධර්ම හා අධර්ම යනුවෙන් අචේතනික මූලධර්ම පහක් දක්වා ඇත. මෙහි ධර්ම හා අධර්ම යනු ස්වභාවයි. භෞතික මූල ධර්මවල ක්‍රියාකාරීත්වය නිර්මාණය කරයි. ජලය මාළුන්ගේ ක්‍රියාකාරීත්වයට පදනම සපයන්නා සේ භෞතික මූලධර්ම ජීවී ආත්මවල ක්‍රියාකාරීත්වයට හේතු වන බව ජෛන මතය යි. (Balbir, 1976, p.115). ධර්මය යනුවෙන් පෙන්වා දී තිබෙන්නේ මූල ද්‍රව්‍යයකි. එය අන්‍ය ද්‍රව්‍යයන්ගේ ක්‍රියාකාරීත්වයට උපකාරී වේ. ධර්මය අනෙකුත් මූලවලට සහාය වුව ද වෙනස් නොවී පවතියි (රාජපක්ෂ, 24 පි). මූලද්‍රව්‍යයන් ක්‍රියාකාරීත්වය ආරම්භ කරන කල ධර්මය එයට පහසුකම් සපයනු ලබයි. ජෛන දාර්ශනික විග්‍රහයට අනුව අජීවී වස්තූන්ගේ ක්‍රියාකාරී හා වෙනස් වීම් විෂයයෙහි ක්‍රියාකාරී මූල ධර්මය වන්නේ ධර්මයයි. සමස්ත විශ්වයේ ම ක්‍රියාකාරීත්වයට ධර්මය උපකාරීවන්නාසේ ම පුද්ගල ක්‍රියාකාරීත්වයේ දී ධර්මය අනුගමනය කළයුතු ආකාරය කොටස් කර දක්වයි.

- නිවැරදි දැක්ම :- ජෛන දර්ශනයේ උගන්වන මූල ධර්ම පිළිබඳ විශ්වාසය
- නිවැරදි අවබෝධය :- සත්‍ය ස්වභාවය පිළිබඳ පූර්ණ අවබෝධය
- යහපත් හැසිරීම :- උපේක්ෂා සහගත හැසිරීම
- මෙහි යහපත් හැසිරීම යන්න ජෛන දර්ශනය තුළ විස්තර කර ඇත්තේ අහිංසාව, සත්‍යය, අස්තේය, බ්‍රහ්මචර්ය හා අපරිග්‍රහ යන උසස් සිල්පද ආරක්ෂා කිරීමයි. මෙහි දී
- අහිංසාව :- කිසිදු ජීවී වස්තුවකට හිංසා පීඩා නො කිරීම හා සියලු සත්ත්වයන්ට කරුණාව දැක්වීම.
- සත්‍යය :- බොරුකීමෙන් වැළකීම මෙන්ම සැමවිට ම ඇත්ත කතා කිරීම
- අස්තේය :-අන්‍යයන්ගේ භෞතික වස්තූන් බාර ගැනීමෙන් හා සොරකම් කිරීමෙන් වැළකී ගෞරවාන්විත ව හැසිරීම

- බ්‍රහ්මචර්ය :- ඉන්ද්‍රියන් පිනවීමට පත්වන සියලු ක්‍රියාකාරකම්වලින් වැළකීම

- අපරිග්‍රහ :- ලොව පවත්නා සියලු වස්තු කෙරෙහි ඇල්මක් නොමැති ව වාසය කිරීම (රාජපක්ෂ, 25 පි).

ජෛන දර්ශනයෙන් මෙවැනි ධර්ම කාරණාවන් තුළින් පුද්ගලයා සදාචාරවත් ජීවන මාර්ගයකට යොමු කරවනු ලබයි. පුරාණ ඉන්දීය සමාජයේ පැවති අයුක්ති සහගත හැසිරීම් ඉවත දමමින් යහපත් චර්යා ධර්මවලින් පිරි ජනතාවක් බිහි කිරීමට උත්සුක වී ඇත. ජෛන දර්ශනය තුළින් භාරතීය සමාජයට සාධාරණත්වය ඉටුවන අයුරින් ධර්ම සංකල්පය විග්‍රහකර ඇත. ධම්ම යන සංකල්පයෙන් සියලු සත්ත්වයන්ගේ ජීවිත ආරක්ෂා කරන්නාක් මෙන් ම වෘක්ෂලතා ආදියෙහි ද අයිතිය තහවුරු කර තිබේ. ඒ අනුව ජීව අජීව වශයෙන් ලොව පවත්නා සියල්ල වෙන්කර දක්වා ඇත. එහි දී ධර්ම යන්න ජීව ගණයට ඇතුලත් කරමින් සිහි නැති යථාර්ථ පහක් දක්වා ඇත.

1. පුද්ගල
2. ආකාශය
3. කාල
4. ධර්ම
5. අධර්ම

ඉහත කරුණු අනුව ජෛන ධර්මය තුළ ධර්ම යන පදය තුළින් සාධාරණත්වය, විනිශ්චය සදාචාරය වැනි පුලුල් අර්ථ රාශියක් අදහස් කර ඇත. ජෛන දර්ශනයේ දී වැරදි ක්‍රියාවන්හි නිරතවන භික්ෂුව පාපකාරී භික්ෂුවක් වශයෙන් උත්තරාධ්‍යානයේ දී හඳුන්වා ඇත. එය උපමාවක් මාර්ගයෙන් දක්වයි. "ඌරකු ධාන්‍යයෙන් පිරි කුඹුරු අතහැර අසුචි අනුභවයට යොමු වේ ද එමෙන් ම පාපකාරී පුද්ගලයා සීලය අතහැර දුස්සීලයෙහි ඇලෙයි"

කණකුණ්ඩගං ච ඉත්තාණං - විට්ටං භුඤ්ජඉ සූයරෙ

එවංසීලං චඉත්තාණං - දුස්සීලෙ රමඊ්මිඑ., (උත්ගල1-5)

යන්නෙන් සදාචාරවත් නොවන පුද්ගලයා හැඳින්වීමට ඉතා සාර්ථක උපමාවක් වනවා පමණක් නොව එයින් සියුම් උපහාසයක් ද ධ්වනිත කරයි. මෙහිදී ශීලය ධාන්‍යයට ද දුස්සීල පුද්ගලයා අසුචිවලට ද පාපකාරී පුද්ගලයා ඌරකුට ද උපමා කරයි.

ජෛනාගමික සදාචාර දර්ශනයේ තවත් සුවිශේෂී අවස්ථාවක් ලෙස පංච විරතිය පිළිබඳ ඉගැන්වීම දැක්විය හැකි ය. පුද්ගලයා හරහා සිදුවන කර්ම නවතාලීමේ ක්‍රියාමාර්ගයක් ලෙස හඳුන්වා දුන් මෙම පංච විරතිය බෞද්ධ දර්ශනාගත පංචසීල ප්‍රතිපදාවට සමානකම් දරයි.

1. අවිහිංසාව (ප්‍රාණඝාතවිරති)
2. සත්‍ය කීම (මුසාවාදවිරති)
3. සොරකම් නොකිරීම (අදින්නාදානවිරති)
4. පරදාරසේවනයෙන් වෙන්වීම (ඒකදාරව්‍රතය)
5. අඩු භාණ්ඩ පරිහරණය (සීමිත වස්තු පරිගහනය)

ජෛනාගමික කර්ම සංකල්පය ද සමාජ සදාචාරය සඳහා ඍජු ලෙස ම දායක වන්නකි. මිනිසුන් තුළ කර්ම හටගැනීම සඳහා මුළාව, අසංවරය, රාගය හා මෝහය හේතුවන බව දක්වන ජෛන මහාවීරයන් කර්ම වළක්වාලීම සඳහා ඉහත දුර්ගුණ ඉවත්කළ යුතු බව ද දක්වයි. සමාජ සදාචාරය පිරිහීම සඳහා එම දුර්ගුණ ප්‍රධාන සාධක වන බව බුදුසමය ද පිළිගනියි. ජෛන කර්ම සංකල්පයේ දී කර්මය ප්‍රධාන කොටස් අටක් වශයෙන් දක්වා තිබේ.

I. ඥාණාවරණිය කර්ම (නුවණ මුළා කරන කර්ම)

II. දර්ශනාවරණිය කර්ම (ආත්මය කිළිටි කරන කර්ම)

III. වේදනීය කර්ම (සැප දුක් තීරණය කරන කර්ම)

IV. මෝහනීය කර්ම (උස්පහත් භාවය ඇති කරන කර්ම)

V. ආයු කර්ම (ආයුෂ නියම කරන කර්ම)

VI. නාම කර්ම (ශරීරාවයව තීරණය කරන කර්ම)

VII. ගෝත්‍ර කර්ම (ජාති කුල ගෝත්‍ර වශයෙන් බෙදන කර්ම)

VIII. අන්තරාය කර්ම (බාධාවන් ඇතිකරවන කර්ම) යනුවෙනි.

මෙවැනි ඉගැන්වීම් පුද්ගලයා විසින් කරනු ලබන ක්‍රියාවට දැඩි බලපෑමක් කළ හැකි ය. සාර්ථක ජීවිතයක් ගෙවීම විෂයෙහි කර්ම සිදුකිරීමෙන් වැළකිය යුතු බව මිනිසුන්ට වැටහීයයි. එවිට නිවැරදි ක්‍රියා පමණක් සිදු කරයි. එය සදාචාරයට විශේෂ උපකාරයකි. බුදුසමය මෙන් යථාර්ථවාදී ස්වරූපයකින් ඉදිරිපත් නො වුණ ද භාරතීය සමාජය සදාචාර සම්පන්න කිරීම විෂයයෙහි කර්මය පිළිබඳ ඉගැන්වීම ඉතා වැදගත් විය. පුද්ගලයා සදාචාර සම්පන්න කිරීම විෂයයෙහි ජෛනාගමික කර්ම ක්‍ෂය කිරීම හා සම්බන්ධ ඉගැන්වීම් හේතු වූ බව සඳහන් කළ හැකි ය. මහාචාර්ය බරුවා මහතා තම කෘතියේ දී ජෛනාගමිකයන් කර්ම ක්‍ෂය කිරීම සඳහා භාවිත කරන ලද ක්‍රමවේද තුනක් දක්වා තිබේ.

1. සීල මාර්ගය

2. තපස් මාර්ගය

3. ආචාර විධි (Barua, 1976, p. 372).

ජෛන දර්ශනයේ සදාචාරය පිළිබඳ ඉගැන්වීම පුද්ගල විමුක්ති මාර්ගය හරහා සිදු වේ. කෙනෙකු කර්ම ක්‍ෂය කොට කේවල ඥානය ලබාගැනීම සඳහා අනුගමනය කළයුතු ගමන්

මර්ගය වන්නේ සදාචාරවත් ජීවිතයක් ගතකිරීම ය. ජෛන දර්ශනයේ පෙන්වා දෙන සත් පදාර්ථයන් අතරින් නිර්ජර හා සංවර අවස්ථාවන්හි දී සත්ත්වයා කර්ම ප්‍රහීණ කිරීමට සදාචාරවත් ජීවිතයක් ගත කළ යුතු වේ. අංග සම්පූර්ණ සදාචාරවත් ජීවතයක් ගත කිරීමේ ප්‍රතිඵලයක් ලෙස විමුක්තිය ලැබිය හැකි ය. එහි දී උපකාරී වන ධර්ම කාරනා සත්තාවාදය වශයෙන් ද හඳුන්වනු ලබයි.

1. ජීව - ආත්මය, ඤාණයෙන් අවබෝධ කළ යුත්තකි. සත්ත්ව ශරීරය ආත්මයේ ආධාරකය වේ.

2. අජීව - ආත්මය හා එක් වූ වස්තු රූපයයි. මෙය වනාහි භෞතික ශරීරයයි. ආත්මය විකාශය වන්නේ අජීව හේතු කරගෙන ය.

3. ආශ්‍රව - ආත්ම සහිත තැනැත්තා පීඩාවට පත්කෙරෙන ලෝභ, ද්වේෂ ආදී ආශ්‍රව මෙයින් දක්වයි. ඒවායේ ආතුර වූ මිනිසා දුකට පත් වේ.

4. බන්ධන - ආශ්‍රව ධර්ම නිසා සත්ත්වයා සසරට බැඳීම සිදුවෙයි.

5. සංවර - ආශ්‍රව නිසා සත්ත්වයා කිළිටි වේ. එය නැවැත්වීම හෝ පාලනය කිරීම සංවරයයි.

6. නිර්ජර - කර්මයන්ගේ ගෙවීයාම හෝ ක්‍ෂය වීම සිදුවන්නේ නිර්ජර නම් වූ තපස මගිනි. උග්‍ර තාපස කර්ම, යෝග වැඩීම මෙහිදී අවශ්‍ය වේ.

7. විමුක්ති - මුළුමනින් ම කර්මයන්ගේ ක්‍ෂයකිරීම විමුක්තිය නැතහොත් මෝක්‍ෂය ලැබීම මෙයින් අර්ථවත් වේ.

විමුක්තිය ලබාගැනීමේ ක්‍රියාවලියේ දී ජෛන මතය වන්නේ පැරණි කර්ම ක්‍ෂය කළ යුතු බව යි. එය කළ හැක්කේ

ව්‍රත සමාදානයෙන් ය. මහා දුක්ඛක්ඛන්ධ, සීහනාද, කුක්කුරවති ආදී සූත්‍ර දේශනා තුළ සඳහන් ආකාරයට ජෛන ශ්‍රාවකයන් විවිධ සීලව්‍රත අනුගමනය කළබව පෙනේ. එනම් කෙලෙස් නැතිකර සදාචාරවත්ව ජීවත්වීමට ශරීරයට දුක් දෙමින් මෙවැනි ව්‍රෘත සමාදන් වී තිබේ.

න නග්න චරියා න ජටා න පංකා
නානාසකා තණ්ඩිලසායිකා වා

රාජොච ජල්ලං උක්කුටිකප්පධානං - සොධෙන්ති මච්චං අවිතිණ්ණකංඛං, (ඛුද්දකනිකාය, ධම්මපදය, දණ්ඩ වග්ගය, 58 පි.)

I. නිර්වස්ත්‍ර ව සිටීම

II. ශරීරයේ මඩ තවරා සිටීම

III. ආහාර නො ගෙන සිටීම

IV. රත් වූ ගල් උඩ නිදා ගැනීම

V. ඇඟ දුවිලි ගෑවෙන්නට හැරීම

VI. ඇණ තියාගෙන සිටීම

ජෛනාගමික ව්‍රත සමාදානයෙන් පුද්ගල සදාචරය සිදුවන බව මේ අනුව පෙනේ. ජෛනාගමෙන් නිර්දේශිත මෙම සදාචාර ධර්ම ක්‍රියාත්මක වන විට සමාජය කොතරම් දුරට සදාචාරවත්ව ගමන් කරන්නේ ද යන්න අවබෝධ කරගත හැකි ය.

ජෛන ධර්මය කුල භේදයට විරුද්ධ නැත. යමෙකුගේ ක්‍රියාවෙන් ඔහු බමුණෙකු හෝ ශූද්‍රයෙකු වේ. ඒ නිසා කවර කුලයක පුද්ගලයෙකුට වුව ද ජෛන සාසනයට ඇතුලු වී දුක කෙළවර කරගත හැකි ය. භාරතීය සමාජයෙන් අහිමි වී තිබූ ආගමික නිදහස බෞද්ධ දර්ශනයෙන් මෙන් ම ජෛන දර්ශනයෙන් ද ලබා දී අසරණ අහිංසක පීඩිත ජනයාට සාධාරණත්වය ඉටුකළ බව පැහැදිලි ය (ධර්මබන්ධු, 1961, 22 පි). භාරතීය සමාජයේ

ආගමික යුගය පහළ වනවිට කාන්තා නිදහස අහිමි වී ගොස් තිබුණි. එවන් පසුබිමක ජෛන දර්ශනය තුළින් කාන්තාව පහත් තත්වයකට හෙළා නොමැත. බුදුසමයේ මෙන් සිවු පිරිසක් ජෛන ශාසනයේ ද දැකගත හැකි ය. ස්ත්‍රීයට පැවිදි ව සිල් ආරක්ෂා කිරීමට අවස්ථාව තිබුණ ද නිර්වාණාවබෝධය ලබාගැනීමට නො හැකි බව ජෛන මතය වේ (අමරසේකර, 1961, 23 පි.). එයට හේතුව වන්නේ ස්ත්‍රියට වස්ත්‍ර ඉවත් කර නිරුවතින් සිටීමට නො හැකි නිසා ය. නිවන් ලබන අන්තිම ආත්ම භාවයේ දී ලජ්ජා පරිත්‍යාග යෙන් ඇඳිවත පවා ඉවත් කර තෘෂ්ණාව නැති කළ යුතු වේ. ලජ්ජාව නිසා කාන්තාවට එය කළ නො හැකි ය. ස්ත්‍රී ආත්මයේ දී සීලා දී ව්‍රත අනුගමනය කරමින් මරණින් මතු පුරුෂ ආත්මයක් ලබාගැනීමෙන් නිවන් අවබෝධ කරගත හැකි වේ. බ්‍රාහ්මණ ආගම මෙන් කාන්තාවට අගමික නිදහස අහිමි කර නොමැති බවත්, භාරතීය සමාජයෙන් අහිමි වූ නිදහස ලබා දී සාධාරණත්වය ඉටු කළ අයුරු මෙවැන්නෙන් පැහැදිලි වේ.

## නිගමනය

ඒ අනුව බලන කල පැහැදිලි වන්නේ භාරතීය සමාජයේ පහළ වූ බොහෝ දර්ශනවාද අතරින් ජෛන දර්ශනය සියලු සත්ත්වයන්ගේ යහපත වෙනුවෙන් ආචාර ධර්ම පද්ධතියක් හඳුන්වා දී ඇති බව යි. එමගින් පුද්ගල චර්යාවන් යහපත් කර සදාචාරවත් සමාජයක් නිර්මාණය කිරීමට ජෛන දර්ශනය මග පෙන්වා තිබේ. ජෛන දර්ශනයෙන් පෙන්වා දී ඇති ආචාර ධර්ම පද්ධතියෙන් ජීව අජීව් සියල්ලන්ට ම සාධාරණත්වය ඉටුවන යුක්තිගරුක, සදාචාරවත්, දැහැමි සමාජයක් නිර්මාණය කිරීමට උත්සුක වී ඇති බව මෙමගින් පැහැදිලි ය.

## ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

අමරසේකර ධර්මබන්ධු, 1961, *ජෛන ආගමය*, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ.

අරියවිමල හිමි, කොස්වත්තේ. (1996). *බුද්ධ ධර්මය*, කොළඹ 10 : සමයවර්ධන ප්‍රකාශකයෝ.

කරුණාරත්න ඩබ්. ඇස්. 1992, *බෞද්ධ දර්ශනය හා චරණය*, සමයවර්ධන ප්‍රකාශකයෝ, කොළඹ 10.

කළුපහන, ඩී. ජේ. 2005, *මුල් බුදුසමයේ ආචාර විද්‍යාව*, තිවිර ප්‍රකාශන.

*ඛුද්දක නිකාය, ධම්මපදය* (2005) දෙහිවල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

චන්දිම හිමි, පනාමුරේ, 2011, *බෞද්ධ ආචාර විද්‍යාව*, මාගධි, පාලි හා බෞද්ධ අධ්‍යයන ප්‍රකාශන ආයතනය, පුවක්පිටිය.

*දීඝ නිකාය, I, II,* (2005) දෙහිවල, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

තිලකරත්න හෙ.මු, 1999, *පෙරදිග ආචාර ධර්ම*, ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ, කොළඹ10.

ප්‍රේමසිරි, පී.ඩී. 2000, *බෞද්ධ ආචාර ධර්ම*, බුද්ධ ශාසන අමාත්‍යංශය, බෞද්ධ කටයුතු දෙපාර්තමේන්තුව, කොළඹ.

රාජපක්ෂ, විජයදාස, 2014, *ධම්ම සංකල්පය හා යුක්ති සංකල්පය*, කර්තෘ ප්‍රකාශන.

Singh Balbir, *The Conceptual Framework of Indian Philosophy*, 1976, P. 116.

B. M. Barua, *A history of pre-Buddhistic Indian philosophy*, 1976, P. 372.